# පොතුවිල් ප්‍රාදේශිය සභාව

## අම්පාර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන .

### 1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 16 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 සැප්තැම්බර් 28 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2011 දෙසැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

### 1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ පොතුවිල් ප්‍රාදේශිය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .

#### 1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

**1.3.2 . ගණකාධිකරණ අඩුපාඩු .**

**----------------------------**

**පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ .**

**( අ ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව ගිණුම් වල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .**

**( ආ ) සභාව විසින් විදුලිය සැපයීමේ වගකීම ලංකා විදුලිබල මණ්ඩලයට පවරා දී තිබුණි . කෙසේ වුවද , විදුලි පාරිභෝගිකයන් ගෙන් හිඟව තිබූ රු . 23,829,350 ක මුදලක් ආදායම් ණයගැතියන්හි ඇතුළත් කර තිබුණි .**

**1.3.3 . බැංකු සැසඳුම් .**

**------------------**

**මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණු රු. 404,456 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් බැංකුව විමසා පසුවිපරම් කටයුතු කර නොතිබුණි .**

**1.3.4 . අනුකූල නොවීම් .**

**---------------------**

**පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .**

| **නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව .** | **අනුකූල නොවීම් .** |
|---|---|
| **( අ ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 .** | **අනුකූල නොවීම් .** |
| **--** | |

| | | |
|---|---|---|
| | රීති අංක 180 | - මුදල් සහ ගබඩා පරිහරණය කරන නිලධාරින් විසින් ආරක්ෂිත ඇප තබා නොතිබුණි . |
| | රීති අංක 217 | - සභාව පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි . |
| | රීති අංක 218 | - සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි . |
| ( ආ ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත . | - රඳවුම් බදු රු . 12,861 ක් අඩු නොකොට ගෙවීම් සිදුකර තිබුණි . |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය .

### 2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු. 3,193,890 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ වියදම් අතිරික්තය රු . 4,731,877 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය .

#### 2.2.1 . ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|

| | | රු.000 | රු.000 | රු.000 |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 15 | 15 | - |
| (ii) | බදු කුලී | 3,240 | 3,177 | 1,264 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,020 | 532 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,105 | 6,105 | - |

**2.2.2 .** උසාවි දඩ .

-------------

අක්කරපත්තු මහේස්ත්‍රාත් උසාවිය විසින් **2010** දෙසැම්බර් **31** දක්වා එකතු කර , පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කරන ලද උසාවි දඩ රු . **3,955,033** ක් සභාව වෙත අයවිය යුතු වුවද එම මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි .

**2.2.3 .** මුද්දර ගාස්තු .

-----------------

**2007 , 2008 , 2009** සහ **2010** වර්ෂ සඳහා වු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

**2.3 .** වියදම් ව්‍යූහය .

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම , තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | |
| | රු . ‘ 000 | රු . ‘ 000 | රු . ‘ 000 |
| පෞද්ගලික පඩිනඩි | 9,415 | 8,429 | 986 |
| වෙනත් | 8,938 | 5,145 | 3,793 |
| | ----------- | ----------- | ----------- |

| | | | |
|---|---|---|---|
| උප එකතුව | 18,353 | 13,574 | 4,779 |
| ප්‍රාග්ධන වියදම් | 7,250 | 8,989 | (1,739) |
| | ----------- | ----------- | ---------- |
| මුළු එකතුව | 25,603 | 22,563 | 3,040 |
| | ======= | ======= | ====== |

**2.4 . මානව සම්පත් කළමනාකරණය .**

**අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .**

**2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ .**

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතියික ශ්‍රේණිය | 07 | 04 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 16 | 15 |
| වෙනත් | - | 15 |
| | ------- | -------- |
| | 24 | 34 |
| | ===== | ===== |

**2.5 . වත්කම් කළමනාකරණය .**

**2.5.1 . ලැබිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය රු . 2,276,381 ක් විය . එයින් වර්ෂය ඉක්ම වූ ගිණුම් වල එකතුව රු . 552,692 ක් විය .

2.5.2 . සමීක්ෂණය නොකළ වත්කම් .

-------------------------------------

විදුලි උපකරණ තොගය භෞතිකව හරිවැරදි නොබලා පොත් අගය මත රු. 249,762 ක් ලෙස දක්වා තිබුණි .

2.5.3 නොගෙවූ බදු .

-----------------

වටිනාකම රු. 2,015,660 ක් වූ භාණ්ඩ හා සේවා බදු සහ එකතු කල අගය මත බදු අඛණ්ඩව සභාවේ තැන්පතු ගිණුමෙහි දක්වා තිබුණි .

2.5.4 නොපියවූ අත්තිකාරම්

-----------------------------

වටිනාකම රු. 18,495 ක් වූ අත්තිකාරම නොපියවා අඛණ්ඩව ගිණුම්වල දක්වා තිබුණි .

2.6 අභ්‍යන්තර විගණනය .

---------------------------

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3. පද්ධති හා පාලන .

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .